පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන හිමි,
(බී.ඒ. (ගෞරව), බෞ.පා.වි., එම්.ඒ. කැලණිය)
තාවකාලික කථිකාචාර්ය,
බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය,
බෞද්ධ අධ්‍යයන පීඨය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
හෝමාගම.

## සූත්‍ර විනය ද්විත්වය හා ශාසනයේ චිරස්ථිතිය

තෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව සූත්‍ර, විනය හා අභිධර්මය වශයෙන් ත්‍රිපිටකය සම්පිණ්ඩනය වුවද සූත්‍ර හා විනය යන ද්විපදයෙන් ගම්‍යය වන අර්ථය කුමක් ද යන්න වටහාගැනීම තරමක දුෂ්කර කාර්යයක් වී ඇත. එය එතරම් ම කර්ණක් වීම සඳහා හේතුවන ප්‍රබල ම සාධකය නම් සූත්‍ර විනය යන ද්වපද බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කරන ලද හෙයිනි. සූත්‍ර විනය වශයෙන් ධර්මය නොබෙදුණු කාල වකවානුක දී බුදුරජාණන් වහන්සේ මින් අදහස් කරන්නට ඇත්තේ කුමක් ද යන්න කා අතරත් කුකුස දනවන්නකි. මේ හේතු කොට ගෙන විවිද විද්වතුන් විවිධ අදහස් දක්වා ඇත. මෙම ලිපියේ අරමුණ වන්නේ සූත්‍ර විනය වශයෙන් ගැනෙන්නේ කුමක්දැයි විමසා බැලීම යි.

<u>මහාපරිනිර්වාණ සූත්‍රයේ</u> [1] දී සතර මහාපදේස කවරේ දැයි හඳුන්වා දෙන බුදුරජාණන් වහන්සේ ඉන් අනතුරු ව ඒ පිළිබඳව කටයුතු කළ යුත්තේ කෙසේ දැයි උන්වහන්සේ පැහැදිළි කරන ලදි. මහාපදේස යනු ධර්මය ශ්‍රාවකයා හෙවත් අනුගාමිකයා වෙත සමීපවන ක්‍රම හතරකි. එලෙසින් ලැබෙන ධර්මය පිළිබඳව කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය විස්තර කර දී මේ දී උන්වහන්සේ විසින් සූත්‍ර විනය යන ද්විපද උපයෝගී කර ගන්නා ලදි. **සුත්තෙ ඔතරන්ති විනයෙ සන්දිස්සන්ති** යන්න එම ක්‍රියා පටිපාටිය යි. මෙහි සඳහන් වන සූත්‍ර යන්න වනය යන්නට වඩා විවාදාපන්න ය. සූත්‍ර පිටකය මූලාශ්‍ර නයින් ගෙන ඇතැම් දේශකයන් විසින් එය පැහැදිලි කළ ද එහි නිරවද්‍යය බව පිළිබඳ විවිද අදහස් උදහස් අනුගාමිකයන් අතර පවා ඇතිවන බව සුලබව දක්කනට ලැබෙන්නකි. ඒ අනුව විවිධ දේශනා මෙන් ම විවිධ අර්ථකථන ශ්‍රවණය කරන අනුගාමිකයින් හෙවත් ශ්‍රාවකයින් විසින් එම කරුණු අවබෝධ කරගැනීම සඳහා නුවණින් විමසා බැලිය යුතුය. දීඝ<u>නිකායේ</u>

[1] දීඝ නිකාය 2, මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු., ශ්‍රී ලංකා ජනරජය, 1976, පිටුව 192.

මහාපරිනිබ්බාණ සූත්‍රයේ ද අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ මහාපදේස[1] සූත්‍රයේ ද මෙම සතර මහාපදේස දක්වා ඇත. මීට අමතරව නෙත්තිප්පකරණයෙහි[2] ද මේ පිළිබඳ ව කරුණු දක්වා ඇත.

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණ සමය විස්තර වන සූත්‍රයක් වන මහාපරිනිබ්බාණ සූත්‍රයේ දී සතර මහාපදේස දේශනා කිරීමට හේතු වූ කරුණු පෙළ දහමින් ම හඳුනා ගැනීමට හැකිය. විශේෂයෙන් ම සාමගාම [3] සූත්‍රයේ සඳහන් වන සිදුවීම මේ සඳහා ඉහල් වූ සමීපතම හේතුව වශයෙන් පෙන්වාදිය හැක. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව ශාසනයේ භාරකාරත්වය පිළිබඳව ඇතිවන ගැටලුව උන්වහන්සේ විසින් විසඳ දුන්න ද එය ප්‍රායෝගික නොවන බව උන්වහන්සේට ම වැටහුණු බව සප්ත අපරිහානිය ධර්ම විමසා බැලීමෙන් පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේට ගුරුවරයෙක් නොමැති වුවත් ගුරුවරයෙකු අත්‍යවශ්‍ය බව උන්වහන්සේ වටහාගත් හෙයින් උන්වහන්සේ විසින් ම අවබෝධ කරගත් ධර්මය ම ගුරුතැන්හිලා තබන්නට බුද්ධත්තවය ලබාගත් මොහොතේ දී ම අදිටන් කරගත්හ. ඒ බව සංයුත්ත නිකායේ ගාරව සූත්‍රයේ සඳහන් වේ.[4] මහාපරිනිර්වාණ සූත්‍රයේ [5] දී ධර්මය හා විනය ගුරුවරයා ලෙස තබාගන්නා ලෙස තම අනුගාමිකයන් උදෙසා අනුදන වදාරණ ලද්දේ උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව ශාසනය නිරවුල් ව පවත්වා ගැනීම සඳහා ය. ධර්මය හා විනය ගුරුතැන්හි ලා තබාගෙන කටයුතු කිරීමට අනුගාමිකයන්ට අවවාද දුන්න ද විවිධ පුද්ගලයන් පසුකාලීන ව ශාසනයට ඒකරාශී වන හෙයින් ඔවුන්ගේ පෘතග්ජන ස්වභාවය හේතු කොට ගෙන එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ ගැටුලු ඇතිවන බව උන්වහන්සේට අවබෝධ විය. ඒ අනුව වජ්ජීන්ගේ අපරිහානිය ධර්ම අධීක්ෂණය කොට තම ශාසනයට එහි ඇති උපයෝගිතාව අවබෝධ කරගත් උන්වහන්සේ තම අනුගාමිකයන් උදෙසා ද සප්ත අපරිහානිය ධර්ම දේශනා කරන ලදි. එම සප්ත අපරිහානිය ධර්මයෝ නම්:[6]

1. නිතර එක් රැස් විය යුතුය.
2. සමඟිව කටයුතු කළ යුතුය.
3. නොපැනවූවක් නොපැන විය යුතුය, පැනවූවක් නොම සිඳිය යුතුය.
4. චිරරාතඥ තෙරුණට ගරුකළ යුතුය.
5. තෘෂ්ණාවගේ කෙළවරට නොයා යුතුය.
6. වන සෙනසුන් අපේක්ෂා කළ යුතුය.
7. සබ්‍රම්සරුන් කෙරෙහි සිහිඑළවා සිටිය යුතුය.

[1] අංගුත්තර නිකාය 2, මහාපදේස සූත්‍රය, බු.ජ.මු., ශ්‍රී ලංකා ජනරජය, 1977, පිටුව 236.
[2] නෙත්තිප්පකරණය, PTS පිටුව 21.
[3] මජ්ඣිම නිකාය 3, සාමගාම සූත්‍රය, බු.ජ.මු., ශ්‍රී ලංකා ජනරජය, 1974, පිටුව 52.
[4] සංයුත්ත නිකාය 1, ගාරව සූත්‍රය, බු.ජ.මු. ශ්‍රී ලංකා ජනරජය, 1960, පිටුව 252.
යන්නූනාහං යවායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්‍වා ගරුකත්‍වා උපනිස්සාය විහරෙය්‍යන්ති.
[5] දීඝ නිකාය, එම, 1976, පිටුව 242.
යො බො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්‍ථාති.
[6] එම, පිට. 120.

නලිනාක්ෂ දත් මහතා පෙන්වා දෙන්නේ 1, 2, 4 සහ 5 වන කරුණු මෙම අපරිහානීය ධර්ම අතර ප්‍රධාන වන බවයි.[1] ඒ අනුව ශාසනභාරධාරීන් ලෙස නිතරගයෙන් පත්වන්නේ චිරරාතඥ වහන්සේලා ය. මේ බව බුදුරජාණන් වහන්සේගේ චිතකය දැවීම සඳහා හේතු වූ සිදුවීම් විමසීමේන් ද තහවුරු වේ. විශේෂයෙන් ම එවකට වැඩසිටි චිරරාතඥයන් වහන්සේ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ය. උන්වහන්සේගේ වැඩමවීම සිදුවන තෙක් බුදුරජාණන් වහන්සේගේ චිතකය නොදැල්විණි. මෙය දෙවියන්ගේ කැමැත්ත මත සිදුවූවක් බව ද සූත්‍රය පෙන්වා දෙයි.[2] එසේ ම බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනක් ගත වීමෙන් පසු පවත්වන ලද ප්‍රථම සංගායනාවේ මූලිකස්ථානය හිමිවූයේ ද මහාකාශ්‍යප මහරහතන් වහන්සේට ය. උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව එම ස්ථානයට පත් වූයේ කාකණ්ඩපුත්ත යස මහරහතන් වහන්සේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙවන ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය උන්වහන්සේට හිමි විය. තෙවන ධර්ම සංගායනාවේ දී ප්‍රධානත්වය ලබාගත් මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ එවකට වැඩසිටි චිරරාතඥයන් වහන්සේ ය. උක්ත කරුණු අනුව ශාසනභාරධාරී භික්ෂූන් විටින් විට වෙනස් වන බව ස්ඵුට වන කරුණකි.

මහාපරිනිබ්බාණ සූත්‍රයේ දී අපට හමුවන සතර මහාපදේස වනාහි බුදුරජාණන් වහන්සේ භෝග නගරයෙහි ආනන්ද චෛතිය නම් ස්ථානයේ දී ආනන්ද හිමියන් අරඹයා දේශනා කරන ලද්දකි.

> ''මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක්, ඇවැත්නි, ධර්මය මෙය යි, විනය මෙය යි, බුද්ධ ශාසනය මෙය යැයි බුදුරජාණන් වහන්සේ හමුවෙහි සිට තමන් විසින් අසන ලද්දේ ය, බුදුරජාණන් වහන්සේ හමුවෙහි දී පිළිගන්නා ලද්දේ යැයි ප්‍රකාශ කළ ද එපමණින් එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නොකළ යුතුය. එම භික්ෂුවගේ වචනය පිළිගැනීම ද ප්‍රතික්ෂේප කිරීම ද නොකොට එම ප්‍රකාශයෙහි පද ව්‍යංජන මැනවින් ඉගෙන සූත්‍රයෙහි බහාලිය යුතුය, විනයෙහි සැසඳිය යුතුය. ඉදින් සූත්‍රයෙහි බහාලන විට විනයෙහි සසඳන විට සූත්‍රයෙහි බහාලිය නොහැකි නම් විනයෙහි සැසඳිය නොහැකි නම් ඒකාන්තයෙන් එය බුදුරජාණන් වහනසේගේ වචනය යැයි වරදවා නොගත යුතුය. ඉදින් සූත්‍රයෙහි බහාලිය හැකි නම් විනයෙහි සැසඳිය හැකි නම් එය භාග්‍යවතුන් වහන්සේගේ වචනය යැයි ගත යුතුය.''[3]

මේ අනුව පැහැදිලි වන කරුණක් නම් යම් අයෙකු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ යැයි යම් කරුණක් පැවසුව ද එමපණින් ම එය පිළිගැනීම හෝ බැහැර කිරීම හෝ

---

[1] N. Dutt, Buddhist Sects in India, Delhi, 1998, p.35.

[2] දීඝ නිකාය, එම, 1976, පිටුව 256
යථා භන්තෙ දෙවතානං අධිප්පායො තථා හෙතු

[3] එම, පිටුව 192.
''සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති'' තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති ච විනයෙ සන්දස්සින්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං, ඉමස්ස ච භික්ඛුනො දුග්ගහිතන්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සීයමානානි සුත්තෙ චෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතො වචනංග. ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිත'න්ති.

නොකළ යුතු බවයි. සූත්‍රයෙහි බහාලිය නොහැකි නම් විනයෙහි සැසඳිය නොහැකි නම් එය නොපිළිගත යුතුය. සූත්‍රයෙහි බහාලිය හැකිනම් විනයෙහි සැසඳිය හැකිනම් එය පිළිගත යුතුය.

එසේ ම තවත් භික්ෂුවක් අසවල් ආවාසයේ වැඩ වාසය කරන මහා සංඝරත්නයෙන් අසා දැන ගත්තේ යැයි ප්‍රකාශ කරයි. තවත් භික්ෂුවක් අසවල් ආවාසයේ වැඩවාසය කරන භික්ෂූන්වහන්සේගෙන් අසා දැනගත්තේ යැයි ද තවත් භික්ෂුවක් අසවල් ආවාසයේ වැඩවාසය කරන භික්ෂුවගෙන් අසා දැනගත්තේ යැයි ද ප්‍රකාශ කරයි. මේ අනුව ධර්මය අප වෙත සමීපවන ක්‍රම හතරක් සතර මහාපදේස නමින් මහාපරිනිබ්බාණ සූත්‍රයේදී පෙන්වා දී ඇත.

1. **බුද්ධාපදේස** - මෙය බුදුරජාණන් වහන්සේගෙන් අසන ලදි.[1]
2. **සංඝාපදේස** - මෙහ මහා සංඝයාගෙන් අසන ලදි.[2]
3. **මහාථේරාපදේස** - මෙය එක් ආවාසයක වසන බොහෝ තෙරුන්ගෙන් අසන ලදි.[3]
4. **ඒකථේරාපදේස** - මෙය එක් ථෙරකගෙන් අසන ලදි.[4]

මෙම සතර මහාපදේසයන් ඔස්සේ අපට ලැබෙන ධර්මය පිළිබඳව විමසා බැලිය යුතු ක්‍රමය නම් සූත්‍රයෙහි බහාලීම හා විනයෙහි සැසඳීම යි. මහා පරිනිබ්බාණ සූත්‍රයේ දී සූත්‍ර හා විනය යන්න නිර්වචනය කොට දක්වා නැති නමුත් එහි අට්ඨකථාව වන සුමංගල විලාසිනිය එය මෙසේ අර්ථකථනය කරයි.[5]

> "සූත්‍ර යනු විනය යි. විනය යනු ඛන්ධකය යි. සැවැත්නුවර සූත්‍ර විභංගයෙහි විනය නම් ඛන්ධකය යි. කොසඹෑනුවර විනයේ මෙසේ විනය පිටකය ද හාත්පසින් ගනු නොලැබේ. උභතො විභංගයට සූත්‍ර, ඛන්ධකපරිවාර දෙක අයත් ය. ඒ අනුව එය විනය පිටකය යි. අනෙක් අයුරින් සූත්‍ර යන්නෙන් සූත්‍ර පිටකයත් විනය යන්නෙන් විනය පිටකයත් ගැනෙයි. සූත්‍ර, විනය, අභිධර්මය වශයෙන් ත්‍රිපිටකය ගැනෙයි. නමුත් අභිධර්මය සූත්‍ර නාමයෙන් හෝ විනය නාමයෙන් නොගැනෙයි. තවද සූත්‍ර නාමයෙන් ගත නොහැකි බුද්ධ වචනයන් නම් ජාතක, පටිසම්භිදා, නිද්දෙසො, සුත්තනිපාතො,

---

[1] එම,
සම්මුඛා මෙතං භගවතො සුතං.
[2] එම,
තස්ස මෙ සංඝස්ස සම්මුඛා සුතං.
[3] එම,
තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං.
[4] එම,
තස්ස ථෙරස්ස සම්මුඛා සුතං.
[5] දීඝ නිකාය අට්ඨකථාව 1, මහාපරිනිබ්බාණ සූත්‍ර වණ්ණනා, චර්ලස් අල්විස් හේවාවිතාරණ, 1989, පිටුව 393.

උභතොවිභංගා පන සුත්තං, ඛන්ධකපරිවාරා විනයොති. එවං විනයපිටකං පරියාදියති. අථවා සුත්තන්තපිටකං සුත්තං, විනයපිටකං විනයොති. එවං ද්වෙයෙව පිටකානි පරියාදියන්ති. සුතතන්තාභිධම්මපිටකානි වා සුත්තං, විනයපිටකං විනයොති. එවම්පි තීණි පිටකානී න තාව පරියාදියන්ති. අසුත්තන්තාභිධම්මපිටකානි වා සුත්තං, විනයපිටකං විනයොති. එවම්පි තීණි පිටකානි න තාව පරියාදියන්ති. අසුත්තනාමකඤ්හි බුද්ධවචනං නාම අත්ථි. සෙය්‍යථීදං- ජාතකං, පටිසම්භිදා, නිද්දෙසො, සුත්තනිපාතො, ධම්මපදං, උදානං, ඉතිවුත්තකං, විමානවත්‍ථු, පෙතවත්‍ථු, ථෙරගාථා, ථෙරීගාථා, අපදානන්ති.

ධම්මපදං, උදානං, ඉතිවුත්තකං, විමානවත්‍ථු, පෙතවත්‍ථු, ථෙරගාථා, ථෙරීගාථා, අපදාන යි.''[1]

තව දුරටත් විනය යන්නට කරුණු ඉදිරිපත් කරන අටුවාවඃ[2]

''යම් ඒ ධර්මයක් දන්නේ ද මේ ධර්මයෝ විරාගය පිණිස හේතුවෙයි, රාගය පිණිස හේතු නොවේ. වෙන්වීම පිණිස හේතු වේ, එක්වීම පිණිස නොවේ. දැඩිව නොගැනීම පිණිස හේතු වේ. මෙය අල්පේච්ඡතාවය පිණිස වේ, බොහෝ දේ පැතීම සඳහා නොවේ. සතුට පිණිස හේතු වේ, අසතුට පිණිස නොවේ. වීර්යාරම්භය පිණිස හේතු වේ, කුසීත බව පිණිස නොවේ. උතුම් විවේකය පිණිසය, එක්රැස්වීම පිණිස නොවේ. මේ ධර්මය යි. මෙ විනය යි. මේ ශාස්තෘ ශාසනය යි.''

මේ අනුව **සුත්තෙ** යන්නෙහි සියලු ත්‍රිපිටක බුද්ධවචනය අඩංගු වේ. **විනයෙ** යනු රාගාදී විනය කාරණා හා සැසඳිය යුතුය යන අර්ථය යි.[3]

කරුණු මෙසේ හෙයින් සුමංගවිලාසිනී අට්ඨකථාවට අනුව පැහැදිලි වන්නේ **සුත්ත** යන්නෙන් ත්‍රිපිටකය ද **විනය** යන්නෙන් රාගවිනය ආදී කරුණු ද ගැනෙන බවයි.

තවද සුත්ත, සුතානුලෝම, ආචරියවාද, අත්තනොමති යන්න ද අටුවාව විවරණය කරයි.

1. සූත්‍ර නම් සංගායනා තුනේ දී සංගායනාවට නැගූ පිටකත්‍රය යි.
2. සුත්තානුලෝම යනු සූත්‍රයන්ට ගැලපෙන යන්න යි.
3. ආචරියවාද යනු අටුවාව යි.
4. අත්තනොමති යනු න්‍යායක් ගැනීමෙන් ලබන අවබෝධය යි.[4]

මහාචාර්ය ඔලිවර් අබේනායක මහාතා පෙන්වා දෙන්නේ මෙහි දී ත්‍රිපිටකය සූත්‍ර නාමයෙන් ගත නොහැකි බවයි. එයට හේතුව වශයෙන් එතුමා දක්වන්නේ **සුත්තේ ඔතාරෙතබ්බානි** යන පාඨය බුදුරජාණන් වහන්සේගේ දේශනා පාඨයක් වීමත් ත්‍රිපිටයකය සංගායනා වීම බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සිදුවීමත් ය. එසේ හෙයන් සූත්තෙ යන්නෙන් සූත්‍ර පිටකය, විනය පිටකය හෝ අභිධර්ම පිටකය ගත නොහැකිය.

---

1 දීඝ නිකාය අට්ඨකථාව 1, (පරි.) මහාපරිනිබ්බාණ සූත්‍ර වණ්ණනා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2008, පිටුව 500.

2 දීඝ නිකාය අට්ඨකථාව 1, එම, 1989, පිටුව 394.

යෙච ඛො තෙ ගෙතමී ධම්මෙ ජානෙය්‍යාසි ඉමේ ධම්මා විරාගාය සංවත්තන්ති නො සරාගාය. විසංයොගාය සංවත්තන්ති නො සංයොගාය අනුපාදානාය සංවත්තන්ති නො සඋපාදානාය අප්පිච්ඡතාය සංවත්තන්ති නො මහිච්ඡතාය සන්තුට්ඨියා සංවත්තන්ති නො අසන්තුට්ඨියා විරියාරම්භාය සංවත්තන්ති නො කොසජ්ජාය පවිවෙකාය සංවත්තන්ති නො සංගණිකාය අපචයාය සංවත්තන්ති නො ආචයාය, එකංසෙන ගොතමී ජානෙය්‍යාසි එසො ධම්මො එසො විනයො එතං සත්‍ථුසාසනන්ති. තස්මා සුත්තෙති තෙපිටකෙ බුද්ධ වචනෙ ඔතාරෙතබ්බානි, විනයේති එතස්මිං රාගාදිවිනයකාරණෙ සංසන්දෙතබ්බානීති.

3 දීඝ නිකාය අට්ඨකථාව 1, එම, 2008, පිටුව 501.

4 දීඝ නිකාය අට්ඨකථාව 1, එම, 1989, පිටුව 394.

සුත්තාදීසු පන සුත්තං නාම තිස්සො සංගීතියො ආරුළ්හානි තීණි පිටකානි, සුත්තානුලොමං නාම අනුලොමකප්පියං, ආචරියවාදො නාම අට්ඨකථා, අත්තනොමති නාම නයග්ගාහෙන අනුබුද්ධියා අත්තනො පටිභාණං.

මෙම කරුණු අනුව අපට පැමිණිය හැකි එකඟතාවය නම් සුමංගලවිලාසිනී අටුවාව දක්වන කරුණු ප්‍රමාණත්වයෙහිලා සැලකිය නොහැකි බවයි. ඒ අනුව නෙත්තිප්පකරණයෙහි මේ පිළිබඳව ඉදිරිපත් කරන කරුණු විමසා බැලිය යුතුය. එහි සුත්තෙ **ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙ තබ්බානි** යන්න විග්‍රහ වී ඇත්තේ මෙසේ ය.

කතස්මිං සුත්තෙ ඔතාරයිතබ්බානි? චතූසු අරියසච්චේසු.

කතමස්මිං විනයෙ සන්දස්සයිතබ්බානි? රාගවිනයෙ, දොසවිනයෙ, මොහවිනයෙ.[1]

මේ අනුව **සුත්තෙ ඔතරන්ති විනයෙ සන්දිස්සන්ති** යන්නට වඩාත් උචිත වන්නේ නෙත්තිප්පකරණයෙහි දක්නට ඇති අර්ථවිවරණය යි. එනම් සූත්‍ර යනු චතුරාර්ය සත්‍යයි. විනය යනු රාගවිනය, දොසවිනය හා මෝහවිනය යි.

අටුවාචාරීන් වහන්සේලා විසින් උක්ත පාඨයට අර්ථ සැපයීමේදී නොයෙකුත් ක්‍රම උපයෝගී කරගෙන ඇති බව මේ අනුව ඉතා පැහැදිලි ය. විශේෂයෙන් ම ධර්ම යන්න විස්තර කරන පෙළ දහම ඒ සඳහා ඉදිරිපත් කරන්නේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ය. එහි චතුරාර්ය සත්‍යය දක්නට නොලැබෙන අතර දක්නට ඇත්තේ එහි සිව්වැනි සත්‍යය වන දුක නැතිකිරීමේ මාර්ගය හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. සාමගාම සූත්‍රයෙහි දක්නට ලැබෙන පරිදි ධර්මයෝ නම් තිස් හතකි. නමුත් ඒවා සූත්‍ර නාමයෙන් නොගැනෙයි. සූත්‍ර නාමයෙන් නොගැනෙන නමුත් ධර්ම නාමයෙන් ගැනෙන සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ නම්: [2]

1. චත්තාරො සතිපට්ඨානා,
2. චත්තාරො සම්මප්පධානා,
3. චත්තාරො ඉද්ධිපාදා,
4. පඤ්චින්ද්‍රියානි,
5. පඤ්ච බලානි,
6. සත්ත බොජ්ඣංගා,
7. අරියො අට්ඨංගිකො මග්ගො.

බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රයේ දී පෙන්වා දෙන්නේ ශාසනයේ පැවැත්මට වඩා හානිදායක වන්නේ මෙම සත්තිස්බෝධිපාක්ෂික ධර්ම පිළිබඳව ගැටලු ඇත්නම් පමණක් බවයි. එසේ ම එම අවස්ථාවේ දී ආනන්ද හිමියන් පෙන්වා දුන්නේ මේ ධර්ම කාරණා සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් නොමැති බවත් ඒ නිමිති කරගෙන බෙදුණු භික්ෂූන් දෙනමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ දක්නට නොමැති බවත් ය. ඒ අනුව පැහැදිලි වන්නේ බුදුදහමේ මූලික දේශනා හේතු කොට ගෙන ගැටලු ඇති නොවන බවයි.

---

[1] Nettippakarana, Paṭiniddesavāro, Yuttihāravibhaṇgo, PTS, p. 21

[2] මජ්ඣිම නිකාය 3. එම, 1974, පිටුව 54.

තං කිං මඤ්ඤසි, ආනන්ද, යෙ වො මයා ධම්මා අභිඤ්ඤා දෙසිතා, සෙය්‍යථීදං - චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣංගා, අරියො අට්ඨංගිකො මග්ගො.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම හේතුකොට ගෙන ගැටලු ඇති නොවුන ද අනෙකුත් දහම් කරුණු හේතුවෙන් අල්පමාත්‍ර වූ විවාද ඇතිවීමට හැකි බවත් ඒ සඳහා හේතුවන විවාද මූල හතරක් ඇති බවත් බුදුරජාණන් වහන්සේ සාමගාම සූත්‍රයේ දී පෙන්වා දී ඇත. එම විවාද මූලයෝ නම්:[1]

1. යම් මහණෙක් කිපෙන සුලු වීම හා බද්ධ වෛර ඇති වීම
2. යම් මහණෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි අගෞරව ව යටහත් පැවතුම් නැතිව වාසය කිරීම
3. යම් මහණෙක් සංඝයා කෙරෙහි ගෞරව නැති ව යටහත් පැවතුම් නැතිව වාසය කිරීම
4. යම් මහණෙක් ශික්ෂා නොපුරන්නේ වීම.

මෙම පාපී විවාද මූලයන්ගෙන් යුක්ත වූ යම් මහණෙක් සංඝයා කෙරෙහි විවාද ඇති කරයි නම් ඒ විවාද බොහෝ දෙනාට අහිත පිණිස, දුක් පිණිස, අනර්ථ පිණිස වේ. ඉදින් ඒ පාපක වූ විවාදමූලයාගේ ප්‍රහාණය පිණිස, මතු නූපදනා පිණිස කටයුතු කළයුතු බව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදි.

මෙකරුණ ඉටු කිරීම සඳහා ප්‍රථමයෙන් ම සප්ත අපරිහානිය ධර්ම අනුගමනය කළ යුතුය. දෙවනුව සතර මහාපදේසයනට අනුව අපට ධර්මය ලැබෙන අයුරු හඳුනාගත යුතුය. තෙවනුව එම ප්‍රකාශ සූත්‍රයෙහි බහාලීම හා විනයයෙහි සැසඳීම සිදු කළ යුතුය. සිව්වනුව එම ප්‍රකාශ සූත්‍රයෙහි බහාලීම හා විනයෙහි සැසඳීම නොකළ හැකි නම් එම ප්‍රකාශ සිදුකරන පාපීහු සසුනෙන් නෙරපා දැමිය යුතුය. යම් හෙයකින් එසේ සිදු කළ හැකි වුවහොත් සම්බුද්ධ ශාසනය චිරාත් කාලයක් ආරක්ෂා කර ගැනීමට අපට හැකි වේ.

[1] එම, පිටුව 54.